# මහජනතාව වෙත කරනු ලබන දැනුම්දීම

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## පරිසීමිත වෙළෙන්දන් (Restricted Dealers) ලෙස පත් කරනු ලැබීම

### ශ්‍රී ලංකාව තුළ 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ පරිසීමිත වෙළෙන්දන් ලෙස මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම (විදේශීය මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම) සඳහා අවස්ථාවක්

ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ නියෝජිත වශයෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත ක්‍රියාත්මක කිරීම සඳහා 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමිත සමාගම්වලට ශ්‍රී ලංකාව තුළ පරිසීමිත වෙළෙන්දන් (Restricted Dealers) ලෙස පත් කරනු ලැබීම සඳහා අවස්ථාව ලබාදීමට අදහස් කෙරේ. විදේශ විනිමය පනතෙහි 4(2) වගන්තියට අනුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලබන නියමයන් හා කොන්දේසිවලට යටත්ව, පරිසීමිත වෙළෙන්දන් හට විදේශ මුදල් මිලදී ගැනීමට, විකිණීමට සහ හුවමාරු කිරීමට හැකිවනු ඇත. මේ සඳහා උනන්දුවක් දක්වන සමාගම්වලට පහත දැක්වෙන කරුණුවලට අනුව, අයදුම්පත් ඉදිරිපත් කළහැක.

**2. අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළයුතු නිර්ණායකයන් සහ අදාළ නියමයන් හා කොන්දේසි**

2.1 පරිසීමිත වෙළෙන්දෙකු ලෙස පත්වීම සඳහා අයදුම්කාර සමාගමක් විසින් ඒ සඳහා සුදුසුකම් ලැබීමට සම්පූර්ණ කළයුතු නිර්ණායකයන් සහ අදාල නියමයන් හා කොන්දේසි පිළිබඳ විස්තර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන http://www.dfe.lk හි ඇතුලත් කොට ඇත.

2.2 මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා ලිත් වර්ෂ පදනම මත පහත සඳහන් (i) හෝ (ii) යටතේ අවසර ලබා දෙන අතර, 2.1 හි සඳහන් නිර්ණායකයන් සහ නියමයන් හා කොන්දේසි සම්පූර්ණ කිරීම සලකා බලා ඊළඟ වසර සඳහා අළුත් අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

i. විදේශ මුදල් මිලදී ගැනීමට හා හුවමාරු කිරීමට
ii. විදේශ මුදල් මිලදී ගැනීමට, විකිණීමට හා හුවමාරු කිරීමට

**3. අයදුම්පත් භාරදෙන ක්‍රමවේදය**

3.1 ඉහත පරිච්ඡේද අංක 2.1හි සඳහන් නිර්ණායකයන් සහ නියමයන් හා කොන්දේසි සපුරන අයදුම්කරුවන්, **නිර්දේශිත ආකෘතියට අනුව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන්** පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

3.2 **අයදුම්කරුවන් සඳහා උපදෙස් :**

i. මුදල් හුවමාරු ව්‍යාපාරය, විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාරව, පවත්වාගෙන යා යුතුය.

ii. **නියමිත අයදුම්පත් ආකෘතිපත්‍රය** විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන http://www.dfe.lk හරහා බාගත කරගත හැකිය.

iii. අයදුම්පත එවනු ලබන ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"පරිසීමිත වෙළෙන්දෙකු ලෙස පත්වීම සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කිරීම අවශ්‍ය වේ.

iv. **පහත සඳහන් අවස්ථාවන්වලදී අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.**

(අ) නියමිත ආකෘතිපත්‍රයට අනුකූලව නොඑවන ලද හෝ නිසි ලෙස සම්පූර්ණ නොකළ අයදුම්පත්

(ආ) අයදුම්පත්‍රයේ **උපලේඛන 1** හි සඳහන් නිර්ණායකයන් සම්පූර්ණ නොකරන ලද අයදුම්කරුවන්

(ඇ) අයදුම්පත්‍රයේ **උපලේඛන 2** හි සඳහන් නියමයන් හා කොන්දේසි සම්පූර්ණ නොකරන ලද අයදුම්කරුවන්

(ඈ) අයදුම්පත්‍රයේ **උපලේඛන 3** හි සඳහන් සියළුම ලේඛනයන් ලබා දී ඇති උපදෙස්වලට අනුව අමුණා නොමැති නම්

**4.** ඉහත සඳහන් වෙබ් අඩවියෙහි දැනට ඇතුලත් කොට ඇති නියමයන් හා කොන්දේසිවලට අමතරව වෙනත් නියමයන් හෝ කොන්දේසි වරින්වර ඇතුලත් කිරීමට හා මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා පරිසීමිත වෙළෙන්දෙකු ලෙස පත් කර ගනු ලැබීමට අයදුම්කරුවෙකු සතු සුදුසුකම් තීරණය කිරීමට සහ අයදුම්පත් භාරගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.


අධ්‍යක්ෂ, විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
☎ 0112398523, 0112398597 @ dfe@cbsl.lk